- මිරිස්, කහ, තුනපහ, ගම්මිරිස් ආදී කුළුබඩුවිරහිත අලවිය අඩු වෙලා තියෙනවා
- කුළුබඩු නිෂ්පාදන විසඳලි වැඩි වී ඇති නිසා කුළුබඩු අපනයනයත් අඩු වෙලා
- ලංකාවේ වැඩියෙන්ම පරිභෝජනය කරන කුළුබඩු වර්ගය ගම්මිරිස්. 2021 වසරේ දී ගණනලීය මට්ටමින් පාවිච්චි කර ඇති මුළු ගම්මිරිස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 11494 ක්.
- 2021 ට සාපේක්ෂව 2022 දී ගම්මිරිස්, සාදික්කා, කහ, ඉඟුරු යන කුළුබඩුවල නිෂ්පාදනය අඩු වෙලා.
- 2022 මුළු ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 111,528 ක්. 2023 දී එය මෙට්‍රික් ටොන් 94,613 දක්වා අඩු වෙලා. පවතින කාලගුණ තත්ත්වයත් සමඟ මේ අඩුවද්දල ලුණු නිෂ්පාදනය තවත් අඩු විය හැකිය.
- මෙරට නිෂ්පාදිත කුරුඳු රටවල් 42 කට යන අතර ලොකීසිකාව්, ඇරෙබිකාව, ජෙරැ යන රටවලින් ඉහළ ඉල්ලුමක්

ලංකාවේ ලුණු - කුළුබඩු පාවිච්චිය අඩු වෙලාද?

ඍජුවන වූ ආර්ථික ප්‍රවණතාවන් සමඟ ජනතාවගේ ආහාර පරිභෝජනය හා බීජී ගැනීම අඩු වී ඇති බවට වන වාර්තා පසුගිය කාලයේදී බොහෝ තිත්ත පළ විය. ඒ අතරින් සමහර ඒවා ඒ සම්බන්ධව කරන ලද සම්ක්ෂණවල ප්‍රතිඵල විය. එබැවින් මෙය අසත්‍යයක් යැයි කියමින් පහසුවෙන් ප්‍රතික්ෂේප කළ හැකි තත්ත්වයක් ද නොවේ. ඇතැම් අඩු ආදායම්ලාභී පවුල්, තුන් වේල පෙලුවට වේදී දෙකක් ආහාර ගැනීමට පුරුදුව ඇති බවට ද ඒ අල්පසන්තෝෂී මහජනතු පාර්ශ්ව විය. මෙවැනි ජනතාවගේ ආහාර පරිභෝජනය අඩුවීමට සාපේක්ෂව කුළුබඩු සහ ලුණු සඳහා වන ඉල්ලුම් ද පහළ ගොස් ඇතැයි වෙළෙඳපොළ ආරංචි මාර්ග සඳහන් කරයි. එබැවින් අපි ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් කළෙමු.

ශ්‍රී ලංකාවේදී ආහාර පිසීම ඇතුළු විවිධ අවශ්‍යතා වෙනුවෙන් කුළුබඩු වර්ග කිහිපයක් භාවිත වේ. ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, කෝපි (වේළන ලද), සාදික්කා සහ වසාවාසි, ඉඟුරු, කහ යනාදියක් උත්තේජක ගෝල වර්ග යටතේ බැලුවි, පුවක් යනාදියක් පෙරමුණේ සපු වේ. ඒවා අතරින් වැඩියෙන්ම පරිභෝජනය කරන කුළුබඩු වර්ගය වෙන්නේ ගම්මිරිස්. ජර විසින් අපහසුන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද දත්තවලට අනුව, 2021 දී මෙරට ජනතාව පරිභෝජනය කර ඇති මුළු ගම්මිරිස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 11494 යි. පුද්ගලයන් සිව් දෙනකුගෙන් සමන්විත පවුලක එවා වසරේ දී පරිභෝජනය කර ඇති ගම්මිරිස් ප්‍රමාණය කිලෝ 2.1 යි. (ග්‍රෑම් 2111.56 යි.) 2022 දී පරිභෝජනය කර ඇති මුළු ගම්මිරිස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 11507 ක් වූ අතර ඒ අනුව, හතර දෙනකුගෙන් යුත් පවුලක එම වසරේ දී පරිභෝජනය කර ඇති ගම්මිරිස් ප්‍රමාණය කිලෝ 2.1 යි. (ග්‍රෑම් 2108.26 යි.) ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි ගෝවලල සමඟින් වාර්ෂික ගණනාවික පරිභෝජනය පිළිබඳ දත්ත පහත වගුවේ දැක්වේ.

සෝප වර්ගය	2021 (මෙට්‍රික් ටොන්)	2022 (මෙට්‍රික් ටොන්)
කුරුඳු	1164	1165
කරාබුනැටි	52	52
කෝපි (ව්‍යසු)	3616	3620
ගම්මිරිස්	11494	11507
සාදික්කා හා වසාවාසි	3	3
එනසාල්	34	34
පුවක්	4360	4365
බුලත්	5968	5975
ඉඟුරු	5195	5201
කහ	9978	9989

(මුලාශ්‍රය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)

ඉහත සංඛ්‍යා දත්ත අනුව යමින් අපට 2021 හා 2022 වසරවල දී පුද්ගලයන් හතර දෙනකුගෙන් සමන්විත පවුලක පරිභෝජනය කර ඇති කුළුබඩු ප්‍රමාණ පිළිබඳ කොටසුද සපයා ගත හැකිය. ඒ අනුව, වර්ෂ 2021 දී පුද්ගලයන් සිව් දෙනකුගෙන් යුත් පවුලක කහ පරිභෝජනය කිලෝ 1.8 ක් (ග්‍රෑම් 1833.05 ක්) වූ අතර 2022 දී එම අගය දැක්වුනේ කිලෝ 1.8 (ග්‍රෑම් 1830.14) ක් හැටියටය. එමෙන්ම පුද්ගලයන් හතර දෙනකුගෙන් සමන්විත පවුලක් 2021 හා 2022 වසරවල දී පරිභෝජනය කර ඇති සමස්ත කුළුබඩු ප්‍රමාණය ග්‍රෑම් 53.45ක් සහ ග්‍රෑම්. ඊට අමතරව සිව් දෙනකුගෙන් යුත් පවුලක් 2021 දී බුලත් කිලෝ එකක් (ග්‍රෑම් 1096.38 ක්) හා 2022 දී කිලෝ එකක් (ග්‍රෑම් 1094.71 ක්) ද පරිභෝජනය කර ඇත. මෙම දෙවසරේ දී එක පවුලක වාර්ෂික ඉඟුරු පරිභෝජනය ග්‍රෑම් 59.63 ක්.

කුළුබඩු පරිභෝජනය අඩුවීමට බලපා ඇති ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ ජනතාවගේ ආහාර පරිභෝජන රටාවේ ඩිඩුව ඇති වෙසෙසකියාය. විශේෂයෙන්ම, පවතින ආර්ථික අර්බුදය හමුවේ දුප්පත් හා අඩු ආදායම්ලාභී ජනතාව ආහාර පරිභෝජනය අඩු කර ඇති අතර පෝෂදායී ආහාර අනුභව කරන්නේ ද අඩුවෙනි. මේ තත්ත්වය මත ගෘහාශ්‍රිත රටවලින් වැඩි වශයෙන් භාවිත වෙන මිරිස්, ගම්මිරිස්, කහ, තුනපහ කුඩු ආදී කුළුබඩු වර්ගවල අලවිය පහළ බැස ඇති බව ශ්‍රී ලංකාවේ කුළුබඩු නිෂ්පාදන ආයතන රැසක ප්‍රකාශකයෝ කිහිප දෙනෙක් අප සමඟ පැවසූහ.

ශ්‍රී ලංකාවේ ප්‍රකට කුළුබඩු නිෂ්පාදන කරන ආයතනයක ඉහළ නිලධාරියකු අප පුවත්පතට පැවසුවේ, පවතින තත්ත්වයත් සමඟ කුළුබඩු නිෂ්පාදන අලවිවෙයින් යම් අඩුවීමක් පෙනෙන්නට තිබෙන බැවින් එයින් තම ආයතනයේ ව්‍යාපාර කටයුතුවලටත් යම් ආකාරයක් අහිතකර බලපෑමක් සිදුව ඇති බවය.

"ලංකාවේ කුළුබඩු අලවිය පහළ බැසලා තියෙනවා. ඒ වගේම පයින් අපේ ව්‍යාපාරවලටත් යම් බලපෑමක් වෙලා තියෙනවා. ඒ සඳහා බලපාන හේතු කිහිපයක් තියෙනවා. එකක් තමයි ජනතාවගේ ආහාර පාරිභෝජනය අඩු වී තිබීම. රට අමතරව තවත් තරගකාරී කුළුබඩු නිෂ්පාදන බිඳී වී තිබීමත් එක අංශයක් කුළුබඩු නිෂ්පාදන අඩු වෙලා තියෙනවා. ඒ වගේම රැකියා අවස්ථා අතින් වූ අඩු සුදු පරිමාණ වාහනයේ කුළුබඩු වෙළෙඳපොළට ඇතුළු වෙලා තියෙනවා. ඒකත් අපේ නිෂ්පාදනවල අලෙවිය අඩුවීමට හේතුවක් වෙලා තියෙනවා. මිරිස්, කහ, තුනපහ, ගම්මිරිස් වගේ කුළුබඩු වර්ග අලෙවිය අඩු වෙලා තියෙනවා. අපි විවිධ හාණ්ඩ වර්ග 53 ක් විතර අලෙවි කරනවා. ඒවායෙන් සියයට 45 ත් 50 ත් අතර ප්‍රමාණයක අලෙවියෙන් අඩු වීමක් තියෙනවා. මිරිස් වර්ග, ගම්මිරිස්, රෝස්ට් කරි පවුඩර් වැනි කුළුබඩු වර්ග අපේ ආයතනය මඟින් අපනයනය කරනවා. ඒ අපනයනවලින් යම් අඩු වීමක් තියෙනවා. නිෂ්පාදන වියදම වැඩි නිසා තමයි අපනයන අඩු වෙලා තියෙන්නෙ කියලා අපි විශ්වාස කරනවා. රටක් විදිහට ගත්තොත් අපේ නිෂ්පාදන වියදම වැඩියි. කුළුබඩු නිෂ්පාදන කරන සමහර රටවල නිෂ්පාදන වියදම අඩුයි. දුර්ගන්ධයකින්, ඉතින්යාව ගත්තොත් නිෂ්පාදන වියදම අපිට වඩා අඩු අගයක පවතින්නෙ. ඒ නිසා කුළුබඩු අපනයනයේ ඒ ඉහළියටවත් ලඟකු නරගකාරීන්වයක් නෑ."

කුළුබඩු නිෂ්පාදනය

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව, 2021 දී කුරුඳු, ගම්මිරිස්, කෝපි (වේළන ලද), කරාබු, සාදික්කා, කරඳමුංගු, කොකෝවා, ඉඟුරු (අඹු), පුවක්, කහ (අඹු), වැනිලා, පැඟිරි, බුලත්, හෝප්, ගොරකා යන කුළුබඩුවල සමස්ත නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් 189727.1 ක් වූ අතර 2022 දී කුළුබඩු නිෂ්පාදන වර්ග 15 ම මුළු නිෂ්පාදන ධාරිතාව යම් අඩුවීමක් පෙන්නුම් කරමින් මෙට්‍රික් ටොන් 173660 ක් වාසනාව සටහන් විය. ජ් යටතේ 2021 දී ගම්මිරිස් මෙට්‍රික් ටොන් 25046.7 ක් නිෂ්පාදනය කර ඇතත් 2022 දී එම අගය 24029 දක්වා මෙට්‍රික් ටොන් 1017.7 ක් අඩු වී තිබේ. 2021 දී කහ මෙට්‍රික් ටොන් 65945 ක් නිෂ්පාදනය කර ඇතත් 2022 දී එම අගය 48869 දක්වා අඩු වී ඇත. තවදුරටත් 2021 ට සාපේක්ෂව 2022 දී ගම්මිරිස්, සාදික්කා, කහ සහ අඟය යන කුළුබඩුවල නිෂ්පාදනය අඩු වී ඇති අතර කුරුඳු, කෝපි (වේළන ලද), කරාබු නැටි, කොකෝවා, පුවක් සහ බුලත්වල නිෂ්පාදනය වැඩි වී තිබේ.

කුළුබඩු අපනයනය

ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත කුළුබඩුවලට ඇත අතිශයින්ම පරාමිති ලෝකයේ විවිධ රටවලින් ඉහළ ඉල්ලුමක් පවතින අතර කුරුඳු, ගම්මිරිස්, කරාබුනැටි, සාදික්කා සහ වසාවාසි ඒ අතර පෙරළුණේ පසුගිය. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් අප ලබා ගත් දත්තවලට අනුව, 2020 දී අපනයනය කර ඇති කුරුඳු ප්‍රමාණය කිලෝග්‍රෑම් 18,721,690 කි. එහි මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් 206,310,961 කි. 2021 දී අපනයනය කර ඇති කුරුඳු ප්‍රමාණය කිලෝග්‍රෑම් 18,814,360 කි. එම තොගයෙහි මුළු වටිනාකම ඩොලර් 230,564,516 කි. 2022 දී අපනයනය කර ඇති මුළු කුරුඳු තොගය කිලෝග්‍රෑම් 18,298,060 ක් වෙන අතර එහි මුළු වටිනාකම ඩොලර් 217,295,201 කි. 2023 දී අපනයනය කර ඇති කුරුඳු ප්‍රමාණය කිලෝග්‍රෑම් 19,676,386 කි. එහි මුළු වටිනාකම ඩොලර් 209,468,850 කි. එම වසරවල දී ශ්‍රී ලංකාවෙන් බැඳිම කුරුඳු ප්‍රමාණයක් අත්‍යනයක කර ඇත්තේ ඕළිවෙළින් මෙක්සිකෝව, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ජේරු යන රටවලිය. එම රටවල් ද ඇතුළුව රටවල් 42 ක මෙට වසාවාසි කුරුඳු අපනයනය කර ඇත.

වසර 2020 දී ශ්‍රී ලංකාව අපනයනය කර ඇති සමස්ත ගම්මිරිස් ප්‍රමාණය කිලෝග්‍රෑම් 9,038,431 කි. එහි වටිනාකම ඩොලර් 49,184,498 කි. 2021 දී ගම්මිරිස් කිලෝග්‍රෑම් 17,960,250 ක් අපනයනය කර ඇති අතර එම තොගයේ වටිනාකම ඩොලර් 113,908,498 කි. 2022 දී කිලෝග්‍රෑම් 11,415,578 ක් අපනයනය කර ඇති අතර එහි වටිනාකම සටහන් වූයේ ඩොලර් 75,933,690 ක් ලෙසය. මේ අතර 2023 දී ගම්මිරිස් කිලෝග්‍රෑම් 14,254,885 ක් අපනයනය කර ඇති අතර එහි වටිනාකම ඩොලර් 90,089,324 කි. අඳළ කාලසීමාවේ දී ශ්‍රී ලංකාවේ ගම්මිරිස් සඳහා වැඩිම ඉල්ලුම තිබී ඇත්තේ ඉන්දියාවෙන් වෙන අතර 2023 දී පමණක් ඉන්දියාවට යවා ඇති ගම්මිරිස් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 13129762 කි. ඉන්දියාව ද ඇතුළුව රටවල් 13 කට මෙට රිහිපාදිත ගම්මිරිස් අපනයනය කෙරේ.

ශ්‍රී ලංකාවේ කරාබුනැටිවලට ද ලෝකයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර, දත්ත පෙන්වා දෙන පරිදි රටවල් 29 කට මෙරට නිෂ්පාදන කරාබු නැටි අපනයනය කරන ලදී. 2020 දී අපනයනය කර ඇති මුළු කරාබු නැටි ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 2,579,364 කි. එහි වටිනාකම ඩොලර් 15,201,955 කි. 2021 දී කිලෝ ග්‍රෑම් 6,478,262 ක් අපනයනය කර ඇති අතර එම තොගයේ මුළු වටිනාකම ඩොලර් 34,852,749 කි. මේ අතර 2022 දී කිලෝ ග්‍රෑම් 2,325,107 ක් අපනයනය කර ඇති අතර සමස්ත වටිනාකම ඩොලර් 20,168,527 කි. 2023 දී කරාබු නැටි කිලෝග්‍රෑම් 5,841,448 ක් අපනයනය කර ඇති අතර එහි වටිනාකම ඩොලර් 43,569,826 කි.

ඉහත සඳහන් කළ කුළුබඩු ද්‍රව්‍යවල අමතරව අපේ සාදික්කා හා වසාවාසිවලට ද ලෝකයේ ඉහළ ඉල්ලුමක් පවතින අතර ඒවා රටවල් 17 කට අපනයනය කෙරෙන බව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රජා වැඩිදුරටත් පෙන්වා දෙයි. එම දත්තවලට අනුව, 2020 දී මෙරට නිෂ්පාදිත සාදික්කා හා වසාවාසි කිලෝග්‍රෑම් 2,046,194 ක් අපනයනය කර ඇති අතර ඒවායෙහි මුළු වටිනාකම ඩොලර් 16,369,744 කි. 2021 දී කිලෝග්‍රෑම් 1,995,364 ක් අපනයනය කර ඇති අතර එහි වටිනාකම ඩොලර් 17,663,143 කි. 2022 දී කිලෝග්‍රෑම් 2,283,898 ක් අපනයනය කර ඇති අතර ඒවායෙහි සමස්ත වටිනාකම ඩොලර් 17,990,649 කි. 2023 දී කිලෝග්‍රෑම් 2,717,914 ක් අපනයනය කර තිබෙන අතර සමස්ත වටිනාකම ඩොලර් 20,506,257 කි.

කුළුබඩු පරිභෝජනයෙහි පහළ යෑමට සාපේක්ෂව ලුණු පරිභෝජනයෙහි ද යම් අඩු වීමක් පෙනෙන්නට තිබෙන අතර ශ්‍රී ලංකා ලුණු සංගමයෙන් ලබාගත් දත්තවලට අනුව, 2021 දී නිපදවා ඇති මුළු ලුණු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 111528 ක් වූ අතර මෙට්‍රික් ටොන් 16915 ක පහළ යෑමක් පෙන්නුම් කරමින් 2023 දී සමස්ත ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 94613 ක් වශයෙන් සටහන් වී තිබේ. වර්ෂමාන්තය වෙන විට මෙරට ජ්තුද්ගලයා දෙනෙකු ලුණු පරිභෝජනය මිලි ග්‍රෑම් 9 ක් බවට එයින් සියයට 70 ක් පමණ වෙළෙඳපොළට සපයනු ලබන්නේ ශ්‍රී ලංකා ලුණු සංගම විසිනි.

ශ්‍රී ලංකා ලුණු සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය අජිත් සෙම්පුගහාදර් මහතා ඉරිදා ලංකාදීපයට පැවසුවේ, පවතින කාලගුණ තත්ත්වයත් සමඟ 2024 දී ලුණු නිෂ්පාදනයෙහි අඩුවීමක් අපේක්ෂා කළ හැකි බවය.

"2022 වසරට සාපේක්ෂව 2023 ලුණු නිෂ්පාදනයෙහි යම් අඩු වීමක් තියෙනවා. ඒක පසුගිය අඳුරුදු 10 ට සාපේක්ෂව 2022 හා 2023 වසරවල ලුණු නිෂ්පාදනයෙහි යම් වැඩිවීමක් දකින්න පුළුවන්. ලුණු නිෂ්පාදනය කාලගුණික තත්ත්ව අනුව වෙනස් වෙනවා. ඒ නිසා ඒක අඩුවැඩිවක ලැබෙන නිෂ්පාදනයට වඩා අඩු ප්‍රමාණයක් ලබා අඩුවැඩිවෙද්දි ලැබෙන්න පුළුවන්. ඒත් 2022 හා 2023 අඳුරුදුවල දී අපිට හොඳ ලුණු අස්වැන්නක් ලැබුණා. විශේෂයෙන්ම 2023 අඳුරුද්දේ කාලගුණ තත්ත්වය ඒවිවර හොඳ තත්ත්වයක් හෙමෙයි තිබුණෙ. ඒත්ෂාව වැඩිපුරත් ලැබුණා. 2024 අඳුරුද්දෙද තත්ත්වය ටිට වඩා බරපතල වෙයි කියලා අපි හිතනවා. එද්දිනෙන් තත්ත්වයකුත් පවතින නිසා. අස්වැන්න ගන්න කිරීයේ පෙබරවාරිවල වුණත් ඒක ගන්න වෙන්නෙ අගුල්වල. ඒ නිසා එතකන් මෘදු දෙකක විතර ප්‍රමාදයක් තියෙනවා. ඒ නිසා ඔේ අඳුරුද්දේ ලුණු නිෂ්පාදනය අඩු වෙන්න ඉඩ තියෙනවා."

ඉතිරි සියලු 30 ත ලුණු අවශ්‍යතාව පෞද්ගලික ආංශය මඟින් වෙළෙඳපොළට සපයන අතර එමඟ පෙරලිමේ පසු වෙන ආයතනයක් වෙන රැකිණි සඹුන ව්‍යාපාරයක් සහාපති ආචාර්ය උපුල් ලියනගේ මහතා සෙ පුවත්පතට පැවසුවේ ආහාර පරිභෝජනයෙහි අඩු වීමට සාපේක්ෂව ලුණු පරිභෝජනයෙහි ද ශ්‍රී පහළ යෑමක් දැකිය හැකි බවය.

"පාස්කු ඉරිදි තුස්ත ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය, ඊට පස්සෙ ඇති වුණු ආර්ථික අර්බුදය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දැඩි අත්තකර බලපෑම් එල්ල වුණා. මේ බලපෑම් සමඟ වෙළඳ දෙයක් තමයි සුබවාදිභෝගි භාණ්ඩ පරිභෝජනය අඩු වීම. මොකද, භාණ්ඩවල මිල ඉරිවම ඉහළ යෑමට සාපේක්ෂව මිනිස්සුන්ගේ ආදායම් තත්ත්වය ටිට සාපේක්ෂව වැඩි වුණේ නෑ. මේ තත්ත්වය නිසා ජනතාවගේ ආහාර පරිභෝජනය අඩු වෙලා තියෙනවා. ඒ බව අපේ සැමිණිණ ත්තවලිනුත් පේනවා. අපේ ආයතනයේ නිෂ්පාදන ඉහළ සුපිරි වෙළෙඳසැල්වල ඉඳන් කුඩා සිල්ලර වෙළෙඳසැල් දක්වා ආවරණය කරනවා. ඒ නිසා පාරිභෝගිකයන්වෙ කම්පිණිව, මිලදී ගැනීමේ ස්වභාවය මේ ආදී සියලු දේවල් අපිට හඳුනාගන්න පුළුවන්. ජ්වගේදී අපිට දැනගන්න ලැබුණු දේ තමයි, රටේ අන්තවශ්‍ය ආහාර වර්ග පරිභෝජනය පවා අඩු වෙලා තියෙනවා කියන එක. ජ් යටතේ මිනිස්සු කන වේල් ගණ අඩු කරලා තියෙනවා. ඊට අමතරව ආහාරයට ගන්නා ව්‍යාංජන ප්‍රමාණයන් අඩු කරලා තියෙනවා. මේ තත්ත්වය නිසා ලුණු පරිභෝජනයේ යම් අඩුවීමක් තියෙන බව අපිට තේරෙනවා. ජ්කට ගේන්න තමයි, කලින් ව්‍යාංජන ප්‍රමාණය අඩු කිරීම නිසා ලුණු පාවිච්චියත් අඩු වීම. ලුණු පරිභෝජනය අඩු වෙලා තිබුණේ අපේ ආයතනයේ ලුණු අලෙවිය අඩු වෙලා නෑ. අලෙවිය වැඩි වෙලා තියෙනවා. ජ්කට හේතුව තමයි අපේ ආයතනය ඇතුළු ප්‍රධාන ලුණු නිෂ්පාදන ආයතන සතුව පසුගිය කාලයේ දී ලුණු සංචිත තිබුණා. නමුත් සුළු පරිමාණ ලුණු නිෂ්පාදකයන් සතුව ලුණු අතිරික්තයක් තිබුණෙ නෑ. ඒ නිසා ඒ ඉල්ලුමත් අපේ ආයතන වෙත ඇදී ආවා. ලුණු පරිභෝජනය යම් පමණකට අඩු වුණාට ලුණු ගෙන්වීමේ ව්‍යාපෘතිත් ලුණු ගෙන්වීමේ අවශ්‍යතාවක් නෑ."

සටහන

■ **උපුල් වික්‍රමසිංහ**